# රුහුණ විශ්වවිද්‍යාලය

## සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව
**(SLQF 9 මට්ටම)**

## අයදුම්පත් කැඳවීම

රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨය මගින් 2016 වර්ෂයේ ආරම්භ කෙරෙන සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MA) සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- **පාඨමාලාවේ ලියාපදිංචියට අවශ්‍ය අවම සුදුසුකම්**

  I. සමාජ විද්‍යා විෂයෙන් අර්ස 30 ඇතුළත්ව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම

  **හෝ**

  II. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් සහිතව සමාජවිද්‍යා විෂය ක්ෂේත්‍රයෙන් අර්ස 30කට සමකළ හැකි පළපුරුද්දක් හෝ පූර්ව හැදෑරීමක් කර තිබීම (රුහුණ විශ්විද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි විය යුතුය)

  III. ඉහත I හෝ II ට සම කළ හැකි සහ රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි වෙනත් සුදුසුකමක් ලබා තිබීම

  IV. රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි පරිදි සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ දැනුමක් සහිතව NVQL-7 සම්පූර්ණ කර තිබීම

- **දේශන පැවැත්වෙන දින :** සෙනසුරාදා පෙ.ව 8.00 - ප.ව 4.00 දක්වා
- **අයදුම්පත් බාර ගන්නා අවසාන දිනය:** 2016 අගෝස්තු 07
- **දේශන මාධ්‍ය:** සිංහල
- **පාඨමාලාවේ කාල සීමාව :** අධ්‍යයන වර්ෂ එකක් හෙවත් සමාසික දෙකකි.
- **පාඨමාලා ගාස්තුව :** රු.70000/=

- **අයදුම්පත්‍ර ලබා ගැනීම:** මහජන බැංකුවේ මාතර උයන්වත්ත ශාඛාවේ අංක **032100160036374** දරණ ගිණුමට බැර වන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට **රු.1000/=ක්** ගෙවා ලබා ගත් ලදුපතෙහි පිටුපස පාඨමාලාවේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කර ඉදිරිපත් කළ යුතු වේ. අයදුම්පත් පැමිණ ලබා ගන්නේ නම් රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨ කාර්යාලය වෙත පැමිණිය යුතු වේ. අයදුම්පත් තැපැලෙන් ලබා ගැනීමට තමන්ගේ නම හා ලිපිනය ලියූ **රු.15/=** මුද්දර ඇලවූ **9"X4"** ප්‍රමාණයේ ලිපි කවරයක් සමග පෙර කී පරිදි **රු. 1000/=** ගෙවා ලබා ගත් ලදුපත සහකාර ලේඛකාධිකාරි, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලිපියේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය.

ලේඛකාධිකාරි<br>
රුහුණ විශ්වවිද්‍යාලය<br>
2016.07.12